## ශ්‍රී ලංකාවේ ගොවිතැන හා බැඳුණු ජන ක්‍රීඩා

### හැඳින්වීම

ඈත අතීතයේ සිට ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වී තිබුණේ කෘෂිකර්මාන්තයයි. මෙයිනුත් එදා ගැමියෝ වැඩි වශයෙන් නියලුනේ වී ගොවිතැන, හේන් ගොවිතැන වගේ යැපුම් කෘෂිකර්මාන්තයේ ය. ඈත අතීතයේ ශ්‍රී ලංකා වැසියෝ මෙම ගොවිතැනින් ස්වංපෝෂිතව පැවැති බව ඉතිහාසය කියා පායි. ශ්‍රී ලාංකිකයන්ගේ ජීවනෝපාය ගොවිතැන හා බැඳුනා සේම ඔවුන්ගේ ජනජීවිතයේ සංස්කෘතික අංග වන නර්තන, ගායනා, ක්‍රීඩා යනාදියත් කෘෂිකර්මාන්තය පසුබිම් කොට පැවැතුනි. එහි දී ජන ක්‍රීඩා වලට හිමි වූයේ ප්‍රධාන ස්ථානයකි. ඒ මහන්සියෙන් ගොවිතැන් කොට අස්වනු නෙලා අටු කොටු පුරවාගත් සමයේ සතුටින් සමරන අවුරුදු උත්සවයේ දීය. විශේෂයෙන් මෙම ජන ක්‍රීඩා වැඩි වශයෙන් එලි දැක් වූයේ සිංහල අළුත් අවුරුදු සමයේය. එසේම ඒ සඳහා වැඩි උනන්දුවක් දැක්වූයේ කුඩා ළමුන්ය. මෙම ක්‍රීඩාවන් කෘෂිකාර්මික පසුබිමකින් කටයුතු කරන ජනකොටස් ඇසුරු කොට බිහි වූ නිසා ඒ සඳහා භාවිතා කරන අමුද්‍රව්‍යත් ගොවිතැනින් ලබාගත් ඒවා වීම විශේෂත්වයකි. එදා ගැමියන් අතරේ ප්‍රචලිත වූ මෙම ක්‍රීඩා වලින් බොහොමයක් අද දක්නට නොලැබෙන අතර ඇතැම් ඒවා අවුරුදු උත්සව වලදී පමණක් දක්නට ලැබේ.


### ඔලිඳ කෙළිය



මේ ක්‍රීඩාව සඳහා ඒ වෙනුවෙන් ලී වලින් සදාගත් පෙතක් ඇත. ඊට ඔලිඳ ලෑල්ල හෙවත් ඔලිඳ කොලොම්බුව කියනු ලැබේ. මෙම කොලොම්බුව දිගටි හැඩයක් ගන්නා අතර ඒ ලෑල්ලේ දිගු අතට දෙපැත්තේ වලවල් හත බැගින් ඇත. පටු අතට කෙළවරේ වලවල් දෙකකි. දිගු අතට ඇති වලවල් වල ඔලිඳ ඇට හතර බැගින් දමා ඇති අතර අනික් අතට ඇති වලවල් දෙක භාවිතා කරනුයේ ක්‍රීඩකයන් උපයා ගන්නා ඔලිඳ ඇට තබා ගැනීමටය. ඒ සඳහා මේ ක්‍රීඩකයන් දෙදෙනා ඒ වලවල් දෙක බෙදාගෙන ඇත. එක් ක්‍රීඩකයෙක් තමාගේ පැත්තේ ඇති වලවල් හතෙන් මුල්ම වලේ ඔලිඳ ඇට අතට ගෙන එක එක ඇටේ ලගම ඇති වලවල් වලට එක අතකට අනුපිළිවෙලින් දමාගෙන යයි. එසේම එය ඉවර වූ විට ඊ ලග වලේ ඇට ටික ගෙන පෙර පරිදි ඇට ටික දමා ගෙන යනු ලැබේ. මෙසේ යන අතර ඔහුගේ ඔලිඳ ඉවර වුනේ ඊ ලග වල හිස් එකක් නම් ඊට පසු වලේ ඔලිඳ ඇට ඔහු සතු වන අතර දැන් ප්‍රතිවාදියාට ඔලිඳ ඇට දැමීමට අවස්ථාව හිමිවෙයි. ඔහු වලවල් වලට ඔලිඳ ඇට දැමිය යුත්තේ අනිත් අතටය. මොහුටද එසේ ඔලිඳ ඇට ඉවරවුන විගස ඊලග වල හිස් එකක් නම් ඊට පසු වලේ ඔලිඳ ඇට ඔහු සතුවෙයි. මේ ආකාරයට ඔලිඳ ඇට වැඩියෙන් රැස්කළ තැනැත්තාට දිනුම හිමි වෙයි.


www.wagabima.com

## නෙරෙංචි ඇදීම




මෙය සෙල්ලම් කළ හැක්කේ එකවර ක්‍රීඩකයන් දෙදෙනකුටය. ඉත්තෝ වශයෙන් බොහෝවිට ගල් කැට හෝ සියඹලා ඇට ලබා ගනී. එක පෙළට ඉත්තෝ තිදෙනෙක් පිහිටියොත් එය ඒනෙරෙන්චියක් ලෙස ගනී. එවිට ප්‍රතිවදියාගේ ඉත්තෙක් ඔහුට වාසිවනසේ පෙතේ ඕනෑම තැනකින් ඉවත් කර ලීමේ බලය ඔහුට හිමිවේ. පෙතේ ඉත්තන් වැඩිපුර ඉතිරි කරගන්නාට ජය හිමිවේ. මෙම ක්‍රීඩාවේ නීති කීපයක් ද ඇත. මුළුවල ඉත්තන් ගමන් කල හැක්කේ ඉර දිගේ පමණි. හරහට ගමන් කල නොහැක. ඒ කියන්නේ උඩ සිට පහලටත් පහල සිට උඩටත් ඒවා ගමන් කරවිය නොහැකි බවයි. ක්‍රීඩකයන් නිතරම උත්සාහ කොට යුත්තේ නෙරෙංචියක් සදා ගැනීමටයි. ඒ මගින් ප්‍රතිවාදියාගේ ඉත්තෝ අඩුකල හැකි නිසා ඔහුගේ ජය තහවුරු කරගත හැකි වේ.

## අඹ ඇට පැනීම



මෙය බොහෝවිට ගමේ ළමයින් අතරේ ගැහැණු පිරිමි භේදයක් නැතුව කාලයකට පමණක් සීමා නොවුණු ක්‍රීඩාවක් ලෙස හඳුන්වා දිය හැකිය. මෙය බට්ටා පැණීම, අඹ කොටු පැණීම යන නම්වලින්ද හඳුන්වයි. බොහෝවිට මෙම ක්‍රීඩාව දෙදෙනෙකුට සීමා කරගත්තත් ඇතැම්විට තුන් දෙනෙක් හෝ හතර දෙනෙක් සහභාගී වූ අවස්ථා ද දැකගත හැකිය. එදා මිදුලේ අදිනලද පෙතේ අඹ ඇටයක් පෙතේ පාදයේ සිට විසිකරන අතර එය පෙතේ කොටුවක් තුලට වැටුනොත් එම කොවුව නොපාගා නොන්ඩියෙන් ගොස් එය රැගෙන ආපසු එයි. ඊ ලඟ ක්‍රීඩකයා ද එයම භාවිතා කරන අතර යම් හෙයකින් අඹඇටය කොටුවක් තුලට නොවැටුනොත් එම අවස්ථාව ඔහුට අහිමි වී ප්‍රතිමල්ලවයාට හිමිවෙයි. මෙසේ කොටු සියළු ටිකම යමෙක් පැන්නාට පසු අවසානයේ අඹඇටය පෙතෙන් ඉහල මත්තට දමා කොටු පණිමින් ගොස් හිස උඩින් පසුපස නොබලා විසි කරණු ලැබේ. මෙහිදී ඒ අඹඇටය පෙතේ කොටුවක් මතට වැටුනොත් එය ඔහු සතුකර ගනී. එය ලකුණු කරන්නේ කොටුව මත කතිරයක් ගසාය. එය නතුකරගත් තැනැත්තාට එම කොටුව තුල තම දෙපා තැබීමට හැකි වීම විශේෂ වාසියක් වේ. කෙසේ වෙතත් අවසානයේ දිනන්නේ පෙතේ කොටු වැඩි ප්‍රමාණයක් අල්ලා ගත් තැනැත්තාය.

## පංචකෙළිය




මෙම ක්‍රීඩාව වැඩිවශයෙන් දක්නට ලැබෙන්නේ සිංහල අවුරුදු සමයේය. මෙම ක්‍රීඩාවට ද පෙතක් භාවිතා කරන අතර ඒ පෙත තුල ඉත්තන් ගමන් කරවීම සිදුකරන්නේ බෙල්ලන් දැමීමෙන් ලබා ගන්නා අගයන් අනුවය. බෙල්ලන් සය දෙනෙකු මේ සදහා භාවිතා කරන අතර ඒ බෙල්ලන් සය දෙනාම මුනින් අතට වැටුනොත් 12 ක් වශයෙන්ද අනික් අතට වැටු නොත් වටිනාකම හයක් ලෙස ගැනේ. එසේම බෙල්ලන් පහක් උඩු අතට වැටුනොත් පහක් වශයෙන් ගැනේ. මෙසේ උඩු අතට පෙරලෙන බෙල්ලන් ගනන අනුව වටිනාකම ගනනය කරන අතර එක හෙවත් ඔන්ඩුව , පහ, හය සහ දොලහ වැටීම එම ක්‍රීඩකයාට බෙල්ලන් දැමීමට තව අවස්ථාවක් හිමි වෙයි. එසේම ඔන්ඩුව, පහ සහ හය සල්ල ං වීම ලෙස හදුන්වන අතර ක්‍රීඩකයා ක්‍රියශීලිවන්නේ එතැන් සිටය. ඉන්පසුවයි ඔහු ලබාගන්නා වටිනාකම් ඉත්තෝ පෙතේ හැසිරවීමට ලබා ගන්නේ. මේ අනුව කණ්ඩායම් දෙකේ සාමජිකයන් මාරුවෙන් මාරුවට පෙත වටේට වාඩි වෙයි. බෙල්ලෝ දැමීම එක තැනකින් පටන් ගෙන එක පැත්තකට ගමන් කරන නිසා කණ්ඩායම් දෙකේ සාමාජිකයන් සියළු දෙනාටම බෙල්ලන් දැමීමට අවස්ථාවක් ලැබෙන අතර එය ලැබෙන්නේ කණ්ඩායම් දෙකට මාරුවෙන් මාරුවටය.

එසේම කණ්ඩායම් දෙකට වෙන වෙනම ඉත්තෝ සිටින අතර ඒවා පහැදිලිව හඳුනා ගැනීම සදහා ඇට වර්ගයක් හෝ පුවක් ගෙඩියක් කුඩාවට කපා ගත් කෑලි හෝ භාවිතා කරයි. ඉත්තෝ පෙතේ හැසිරවීම කණ්ඩායමේ නායකයා විසින් කරණුයේ සල්ලම් වූ එක් එක් සාමාජිකයා බෙල්ලෝ එහෙම නැත්නම් කවඩි සොලවා බිමල හැලීමෙන් ලබාගන්නා අගයන් මතය. එක් පාර්ශ්වයේ ඉත්තෝ එක අතකට හසුරුවන අතර අනික් පාර්ශ්වයේ ඉත්තෝ ගමන් කරනුයේ ඊට ප්‍රතිවිරුද්ධ දිසාවටය. එක් පාර්ශවයක ඇති ඉත්තෙක් අනික් පාර්ශ්වයට කැපිය හැක්කේ මුල් පාර්ශවයේ ඇති ඉත්තා අනික් පාර්ශ්වයේ ඇති ඉත්තා මතට ඇති දුර කොටු ගානනට සමාන අගයක් අදාල පාර්ශ්වයේ ඉත්තෝ දැමීමේ දී වැටීමෙන් පමණි. එහෙත් පහ හෝ හය අගයන් වැටීම නිසා එය අවශ්‍ය ලෙසට කඩා ගැනීමේ විශේෂ හැකියාවක් ඇත. ඒ අනුව අවස්ථානු කුලව එම අගය කඩා ගෙන ප්‍රදිවාදී පාර්ශ්වයේ ඉත්තෝ කැපිය හැකි අතර එසේ කපන ලද ඉත්තෝ ගමන ආරම්භ කලයුත්තේ මුලසිටය. එසේම ඉදිරියට ගෙනයන ඉත්තෝ ජයග්‍රාහීව ඉදිරියට ගෙනගොස් අවසානයේ පෙතෙන් ඉවත්කර ගත හැක්කේ එම පාර්ශ්වය බෙල්ලන් දැමීමෙන් ලබා ගන්නා අගයන් මත පිහිටාය. කේසේ වෙතත් පෙතේ ඉත්තන් හිස්කරගන්නා පාර්ශ්වය ජයග්‍රහනය කරණු ලැබේ.

## තට්ටු පැනීම

මෙය ද කොටුපැණීමේ ක්‍රීඩාවකි. දෙපැත්තට කොටු තුන බැගින් අදින ලද කොටු හයක් ඇත. ප්‍රධාන වශයෙන් කුඩා ගැහැණු ළමුන්ගේ ක්‍රීඩාවක් වන මෙය බොහෝ විට සෙල්ලම් කරණුයේ දෙදෙනෙකි. මෙහි දිද අඹඇටයක් හෝ වෙනත් පැතැලි යමක් භාවිතා කරන



අතර එය පෙත මුළ සිට එක් එක් කොටුවට විසි කරණු ලැබේ. මුල්ම කොටුවට දමනලද එය නොන්ඩියෙන් කොටුවෙන් කොටුව ගොස් එම බට්ටා මතටම නොන්ඩියෙන් පැ නඑය නොන්ඩියෙන්ම පෙතේන් එලියට දැමිය යුතුය. එසේ නොවූවහොත් හෝ නොණ්ඩි කකුල බිම ගැවුනහොත් ඔහුගේ වාරය අවසන් වන අතර එහිදී අනික් තැනැත්තාට අවස්ථාව සැලසේ. එසේම බට්ටා දැමීමේ දි ඉරක් මතට වැටුනොත් ද ඊලග තැනත්තාට අවස්ථාව සැළසේ. සියළුම කොටු මේ ආකාරයට දැමීමෙන් පසු බට්ටා පෙතේ ඉස්මත්තට විසිකර පෙතේ සිට නොණ්ඩියෙන් ඒ මතට පැන එය අතට ගෙන තම හිසට උඩින් දැමීමෙන් කොටු අයිති කර ගත හැකිය. එසේ තමා සතු කරගත් කොටු වල තමාට කකුල් දෙකම තැබිය හැකිවීම විශේෂ වාසියකි. එහෙත් ප්‍රතිමල්ලවයාට එම කොටු කිසිවක් පෑගිය නොහැකි අතර යම්හේතුවකින් පෑගුනහොත් එම වාරය නැවතත් ඊලග තරග කරුට හිමිවේ. කෙසේ වෙතත් තරගයේ ජයග්‍රාහකයා වන්නේ කොටු වැඩිප්‍රමාණයක් හිමිකරගත් තැනැත්තාය.

## ගුඩු ගැසීම හෙවත් කල්ලි කෙළිය



මෙය බොහෝවිට පිරිමි ළමුන් අතරේ භාවිතාවන ක්‍රීඩාවකි. මේ සඳහා ගසකින් කපාගන්නා දිගු දණ්ඩක් මෙන්ම අගල් තුනහතරක කුඩා ලී කැබැල්ලක් භාවිතා කරයි. ක්‍රීඩකයන් වැඩිදෙනෙකුට සහභාගිවිය හැකි අතර තනිතනිව හෝ පිල් දෙකකට බෙදී ද කලහැකිය. මෙම ක්‍රීඩාවේදී එකිනෙකා ලකුණ රැස්කිරීම කරගනු ලැබේ. දිගට හාරාගත් කුඩාවලක හරහට තබන ලද කුඩා ලීකැබැල්ල දිගු ලීයෙන් ඈතට විදින අතර යම් අයුරකින් අනික් ක්‍රීඩයකු බිම වැටීමට නොදී අල්ලා ගතහොත් එය විදපු තැනැත්තා දැවීයනු ඇත. නැතහොත් එම ලී කැබැල්ල අහුලාගෙන සළකුණු කරගත් එක්තරා දුරක සිට එය වලදෙසට දමන අතර ඊට තම අත ලීයෙන් ඈතට විසිවනසේ ගසා ලකුණු රැස්කිරීම කරයි. එහි දි කරන්නේ එම කුඩා ලී කැබැල්ල වැටුණ තැනට ඇති දුර විදීමට උපකාරී වූ ලීයෙන් මැණීමයි. එම මිම්මෙන් දහයක් ගුඩ්ඩක් ලෙස හඳුන්වයි. වැඩිම ලකුණු ප්‍රමාණයක් රැස්කරන්නා තරගයේ ජයග්‍රාහකයා වෙයි. එසේම ලී වැදී යන අතරතුරදීද යමෙක් එම ලී කැබල්ල බිම වැටීමට නොදී අල්ලා ගතහොත් ද ඔහු දැවීයනු ඇත. තවද එම වල මතට හො ලී මිම්මෙන් අඩු දුරකට යමෙකු විසින් මෙම කුඩා ලී ය දැමුවහොත් ද විදි තැනැත්තා දැවීයනු ඇත. මෙම ක්‍රීඩාව කළයුත්තේ ඉතාම පරිස්සමෙන් බව ක්‍රීඩකයෝ අත්දැකීමෙන්ම දනි.

## චක්ගුඩු පැනීම

මෙය ළමුන් දෙපිලකට බෙදී කරන සෙල්ලමකි. ඈත අතීතයේ පාසැල් විවේක කාලයේ දී ද පාසැල් නිවාඩු කාලයේ දී ද ළමුන් රැස්වී මෙම ක්‍රීඩාව කරණු ලැබේ. මෙම කණ්ඩායම් දෙකටම නායකයන් දෙදෙනෙකි. සෙල්ලම් කරන සීමාව පිට්ටෙනියේ හතරැස් ලෙසට ඇද

www.wagabima.com

ලකුණු කරඇති අතර එය දෙකට බෙදා කණ්ඩායම් දෙකට ලබා දී ඇත. එක කණ්ඩායමක අයෙකු ගුඩු ගුඩු කියමින් අනික් කණ්ඩායමේ කොටසට ගොස් එහි අයෙකුගේ ශරීරය අල්ලා ආපසු පැමිණිය යුතුය. එවිට එම කණ්ඩායමේ අයෙකු දැවී යයි. එසේම යම්හේතුවකින් ගුඩු ගුඩු කිවීම ක්‍රීඩකයා ක්‍රියාකාරි විට දී නතර වුවහොත් ඔහු දැවීයතු ඇත. එසේම විරුද්ධ කණ්ඩායම මගින් මොහුව අල්ලාගෙන ගුඩු හිදෙනතුරු ඔහු රදවාගෙන තැබීමෙන්ද ඔහු දැවීයාමට සැලැස්විය හැකිය. එක කණ්ඩායමක සියළුම ක්‍රීඩකයන් දැවීයාමට සැලස්වීමෙන් අනික් කණ්ඩායමට ජයග්‍රහණය හිමිවේ.

## දාං ඇදීම



මෙය දෙදෙනෙකුට පමණක් කළ හැකි ක්‍රීඩාවකි. බොහෝවිට ගැමියෝ ගොවිතැන් කටයුතු නිමකොට හවස් කාලයතුල කඩමණ්ඩියට ගිය විට දාං ඇදිමේ ක්‍රීඩාවෙහි නිරත වෙන අයුරු පෙර කාලවලදී දැකගත හැකිවිය. මේ සදහා දාං පෙතක් භාවිත වන අතර එය ලෑල්ලක හෝ ඝන කාඩ්බෝඩ් අදිනලද එකකි. ඇදීමට භාවිතා කරන ඉත්තන් ද බොහෝවිට සකසා ඇත්තේ ලී වලින්ය. එවා වර්නදෙකක් භාවිතා කොට සකසා ඇත්තේ තරඟ කරන පුද්ගලයන් දෙදෙනාට තමතමන්තේ ඉත්තෝ හදුනා ගැනිමේ පහසුව සදහාය. එක් එක් අය සදහා ඉත්තන් 15 බැගින් ඇති අතර ඉත්තන් වැඩිප්‍රමානයක් ඉතිරිවන තැනැත්තා දිනුම ලබාගනී. එක් ක්‍රීඩකයෙක් ඉත්තෙක් ඇදීමෙන් පසුව අනික් තැනැත්තාට ඊලගට අවස්ථාව උදාවෙයි. ඉත්තම් ඇදීම ඉතා කල්පනා කාරීව කලයුත්තේ එය ප්‍රතිවාදියාගේ ගොදුරක් පත්වීමෙන් වලකා ගැනීමට සහ තම ඉත්තෙක් පෙතේ කෙලවරට යවා ඒ ඉත්තා දාංකරවා ගැනීමේ අවස්ථාව උදාකරගැනීම සදහාය. දාං වූ ඉත්තෙකුට වරප්‍රසාද රාසියක් හිමිවන අතර එමගින් අනික් පර්ශ්වයේ ඉත්තන් කැපීම වේගවත් කළහැකි වනුඇති අතර ඔහුට ජයග්‍රහනය කරගැනීමේ සම්භාවිතාවය වැඩිකරගත හැකිය.

## ගල් කෙටීම

මෙය කුඩා ගැහැනු ළමුන්ගේ ක්‍රීඩාවකි. මෙහි දී කරණුයේ රවුම් බොල ගල් පහක් තෝරා ගෙන මුල්ම ක්‍රීඩකයා විසින් එම ගල් පහ පොළවේ විසිරී යන සේ දැමීමයි. ඉන් පසුව එකක් උඩ දමා එය බිම පතිත වීමට කලින් එක ගල් කැටයක් අතට ගෙන උඩ දැමූ ගල් කැටය ඇල්ලීමයි. සාර්ථකව එසේ සියළුම ගල් කැට ඇල්ලූ පසු දෙවනුව එකක් උඩ දමා ගල් කැට දෙකක් එකට ඇසිලීම කරණු ලැබේ. තුන්වනුව ගල්කැට තුනක් ද හතරවනුව ගල් කැට හතරක් ද ආදී වශයෙන් මෙම ක්‍රීඩාව කරණු ලැබේ. යම් හේතුවකින් ගල් කැටයක් ගිලිහුණොත් ඊ ලගට අවස්ථාව ලැබෙන්නේ ඊ ලග තැනැත්තාටය. මෙය සාර්ථකව කරණ වාරගනන වැඩිතැනැත්තා ජයග්‍රාහකයයි.

### ඉරටු බෑම

මෙම ක්‍රීඩාව දෙදෙනෙක් ඊට වැඩි ගණනකට එකවිට කළහැකි වුවත් කුඩා ළමුන් දෙදෙනෙක් ඉතා කලාතුරකින් සෙල්ලං කරුණු දක්නට ලැබෙන සෙල්ලමකි. මෙහි දී එකසමාන කුඩා ඉරටු කෑලි 10 ක් හො 15 ක මිටියක් සාදා එය විසිරෙන්ට නොදී එකටම වැටෙනසේ බිමට හලනු ලැබේ. එක් එක් ක්‍රීඩකයා අග නමා ඉරට කුරකින්ම හදා ගත් කොක්කක් මගින් අනික් ඉරටු සෙලවීමට භාජනය නොකර භාගත යුතුය. යම් එක ඉරටුක් ඇද ගැනීමේදී තවත් එක් ඉරටුවක් හෝ කීපයක් සෙලසුනහොත් ඔහුගේ ප්‍රතිවාදියාට අවස්ථාව සැළසෙයි. මෙසේ මාරුවෙන් මාරුවට ක්‍රීඩාවේ යෙදෙන අය අවසානයේ රැස්කර ගන්නා ඉරටු කූරු ගනන්කර වැඩිම ප්‍රමානයක් හිමිකරගන්නාට දිනුම දෙනු ලැබේ.

## සිංහල අළුත් අවුරුදු උත්සවයේ දී ගොවිතැන හා බැඳුනු ක්‍රීඩා

### පොර පොල් ගැසීම

දේව විස්වාසයක් මුල්කරගෙන සිදුකරන මෙම ක්‍රීඩාවට උඩ පිල සහ යටිපිල වශයෙන් කණ්ඩායම් දෙකකි. සීමා මායිම් ලකුණු කර සිදුකරනු ලබන මෙම ක්‍රීඩාව උඩු පිලෙන් එවනු ලබන පොල් යටිපිලෙන් බිඳිනු ලබයි. එසේම යටිපිලෙන් උඩුපිලදෙසට එවනු ලබන පොල් උඩුපිලෙන් බිදහෙලනු ලැබේ. අවසානයේ පොල් නොබි දී ඉතුරු වූ ප්‍රමානය ගනන්කර වැඩිපුර ඉතුරු කරගත් පිලට ජයග්‍රහනය දෙනු ලැබේ.

### පැපොල් ගෙඩියේ ඇට ගනන් කිරීම

මෙය ක්‍රීඩාවක් ලෙසට නොව සිංහල අවුරුදු තරඟයක් ලෙසට යොදාගනු ලැබේ. මුලින්ම මෙම ගස් ලබුගෙඩිය හෙවත් පැපොල් ගෙඩිය සියළු දෙනාටම ප්‍රදර්ශනය කරන අතර එම තරඟයට සහභාගිවන්නන් එම ගෙඩියේ අඩංගු වියහැකි ඇට ගණන අනුමාන කොට සටහන් තබති. අවසානයේ පැපොල් ගෙඩිය කපා එහි අඩංගු ඇට ප්‍රමානය ගනන් කරයි. මෙහි ඇති ඇට සංඛ්‍යාව හරියටම කියූ තැනත්තා හෝ එසේ නොමැතිනම් ආසන්න වශයෙන් හෝ කියූ තැනැත්තා ජයග්‍රාහකයා ලෙස ප්‍රකිශයට පත්කෙරේ.

### තරගෙට පොල් අතු විවීම



මෙම තරඟයට ඉදිරිපත්වන්නන් සදයා එක හා සමාන දිගකින් හෝ පලලකින් යුත් පොල්අතු සපයා දෙනු ලැබේ. දෙන ලද විධානයකට අනුව පොල් අතුවිවීමේ තරගය පටන්ගන්නා අතර මනාලෙස වියා කලින් අවසන් කල තැනැත්තා ජයග්‍රාහකයා ලෙස සලකනු ලැබේ.

### අලියට ඇස් තැබීම

මෙය ද අවුරුදු උත්සවවලදී පොඩිලමුන් සදහා යොදා ගන්නා තරඟයකි. කළු ලෑල්ලක අඳින ලද අලියෙකුගේ පින්තූරයට ඇසක් ලකුණු කිරීම මෙහි දී තරඟයක්

www.wagabima.com

වනු ඇත. ගැහැණු පිරිමි සියළු දෙනා මෙ සදහා සහභාගී වන අතර ඊට සහභාගි වන්නන්ගේ ඇස්දෙක ලේන්සුවකින් ආවරනය කිරීමත් ඔහුට දෙන ලද සුදුහුණු කූරකින් අදින ලද අලියාගේ ඇස් ලකුණු කිරීමටත් ඉඩ දෙයි. තරගය දිනන්නේ අලියාගේ ඇස හරියටම ලකුණු කර තැනැත්තා වන අතර එසේ කෙනෙකු නැතිවිට ආසන්නතම ලකුණ තබන්නා වනු ඇත.

## තරඟෙට පොල් ගෑම



බොහෝවිට ගැහැණු පිරිමි වැඩිහිටි අය සහභාගී වන මෙම ක්‍රීඩාවද දක්නට ලැබෙනුයේ අවුරුදු උත්සව වලදිය. සහභාගීවන සංඛ්‍යාව අනුව මේ සදහා එක හා සමාන ප්‍රමානයකින් යුතු පොල් සපයා ගනී. එය ගෑමට අවශ්‍ය හිරමන තම තමන් සපයා ගත යුතු අතර අනකරන ලද විධානයකට අනුව සපයනු ලබන පොල් බැ ගෑයුතු වෙයි. මෙහි දී පොල් බෑ දෙකම කලින් ගා ඉවර කරන ලද තැනැත්තා එය ඒ සදහා වූ නිරික්ෂක මණ්ඩලයට පෙන්විය යුතුවෙයි. ගා ඇති පොල්වල ස්වබාවය සහ ඊට ගතව ූකාලය සැලකිල්ලට ගෙන පොල් ගෑමේ තරඟයේ ජයග්‍රහකයා තෝරනු ලැබේ.

## කඹ ඇදීම



අවුරුදු උත්සව වලදී කණ්ඩායම් දෙකක් අතර පවත්නා තරඟයක් ලෙස මෙය හැදින්විය හැකිය. මෙම කණ්ඩායම් දෙකට නායකයන් සිටින අතර මේ සදහා භාවිතා කරණුයේ සවිමත් කඹයකි. තරඟය පැවැත්වීමේ අවස්ථාව එනවි කණ්ඩායම් නියකයන් තමතමන්ගේ කණඩායම් සකස් කරගතයුතුය. බොහෝවිට සවිමත් පුද්ගලයන් කණ්ඩායම් මුලින් තබාගන්නා අතර කණ්ඩායම් දෙක දෙපැත්තට වී කඹය තදින් අල්ලා ගනී. විධානය ලද විගසම කඹය තම කණ්ඩායම  දෙසට ඇදීමට පටන් ගනී. ඒ අනුව එක කණ්ඩායක් එක දිසාවටත් අනික් කණ්ඩායම ඊට ප්‍රතිවිරුද්ධ දිසාවටත් කඹය ඇදිමට පටන් ගනී. තම පැත්තට කඹය ඇදගත් කණ්ඩායම ජයග්‍රහනය කරන අතර එසේ දෙනලද වාර තුනකදී වැඩි වාර සංඛ්‍යාවක් ජයග්‍රහනය කරන කණ්ඩායමට ජය හිමිවෙයි.